# Annual Performance Report
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்தச் செயல்திறன் அறிக்கை

2012

**Department of Pensions**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

# පටුන

පිටුව


1.හැඳින්වීම, දර්ශනය, මෙහෙවර, පරමාර්ථය, අරමුණු හා කාර්යය භාරය 03-04

2.මහජන සම්බන්ධතා අංශය 05

3.ලියාපදිංචි ශාඛාව (සිවිල් ලේඛණාගාරය, තැපැල් අංශය) 06-08

**4.**තොරතුරු තාක්ෂණ ශාඛාව 09

5.සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය 10-11

6.වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අංශය 12-18

7.ප්‍රතිපත්ති අංශය 19-20

8.නීති අංශය 21-23

9.පාලන හා පුහුණු අංශය 24

10.විදේශ විශ්‍රාම වැටුප් අංශය 25-26

**11.**රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල 27-33

**12.**අභ්‍යන්තර විගණන අංශය 34-37

13.ගිණුම් අංශය 39-49

**14.**ඇමුණුම් **49-62**

## හැඳින්වීම

1970 වසරේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ආරම්භ විය.ඊට පෙර මහා භාණ්ඩාගාරය යටතේ පැවති විශ්‍රාම වැටුප් අංශයත්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් උප දෙපාර්තමේන්තුවත්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලත් ඒකාබද්ධකොට 1970 වසරේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

මධ්‍යම රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය, සන්නද්ධ හමුදා අධිකරණ සේවා සහ අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයන් වෙනුවෙන් පාරිතෝෂිත සහ විශ්‍රාම වැටුප් ගෙවීම, එමෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය පරිපාලනය කිරීමත් , රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පවත්වා ගැනීමත් මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

## දර්ශනය

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහිකිරීම.

## මෙහෙවර

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරින්ගේ සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුළින් ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්ත්වය නඟා සිටුවීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සක්‍රීය දායකත්වය නිබඳව ලබා දීම.

## පරමාර්ථය

රාජ්‍ය නිළධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම මඟින් රාජ්‍ය සේවකයින්ට ඔවුන්ගේ කලත්‍රයන්ට හා යැපෙන්නන්ට අනාගත ආරක්ෂාව සැලසීම මෙන්ම සුභසිද්ධිය සහතික කිරීම.

## අරමුණු හා කාර්යභාර්යයන්

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය පාදකකොට ගෙන රාජ්‍ය, පළාත් සභා, සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති සකස් කිරීම සහ පාරිතෝෂිත දීමනා ඇතුළු විවිධ විශ්‍රාම හිමිකම් ගෙවීම.

- රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් සම්බන්ධයෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයන් උදෙසා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- පළාත් පාලන සේවා නිලධාරීන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් සඳහා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- ජාතික, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමෙන් විශ්‍රාම වැටුප් ගෙවීම, පරිපාලනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

- විශ්‍රාමික සංගම් ප්‍රමුඛ කොට ගත් ‘සිවිල් සමාජය ’සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගැනිම.

මෙම අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශයන් යටතේ කටයුතු කරයි

**මහජන සම්බන්ධතා අංශය**

විශ්‍රාමික ප්‍රජාව සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගැනිම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ඉදිරි පිවිසුම් කාර්යාලය පවත්වාගෙන යෑම.
- 1970 කෙටි දුරකතන සේවය පවත්වාගෙන යෑම.
- විශ්‍රාමික සංගම් ලියාපදිංචි කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- www.pensions.gov.lk නිල වෙබ් අඩවිය මගින් සම්බන්ධ විමට අවස්ථාව සැලසිම.
- තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගැටළු ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබාදිම.
- ඉ - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය යටතේ විමසීම් කළමනාකරණයට වෙනම ක්‍රියාවලියක් ස්ථාපිත කිරිමට කටයුතු කිරිම.

**2012 වසරේ ඉටුකල කාර්යභාරය :-**


1. 2012 වසරේ දෙපාර්තමේන්තුවට පැමිණි සේවාලාභින් 33591 අතුරින් සඳුදා හා බදාදා නොවන දිනවල පැමිණි සේවාලාභීන්ගේ විමසීම් සඳහා ඉදිරි කාර්යාලයේදී පිළිතුරු ලබාදීම සහ සඳුදා හා බදාදා දින වලට පැමිණි සේවාලාභීන්ට දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් හමුවිමට මඟපෙන්විම.
2. 2012 වසරේදී 1970 කෙටි දුරකතන සේවා ඔස්සේ ඉදිරිපත් වු 33533 විමසීම් සඳහා පිළිතුරු ලබාදීම.
3. ලියාපදිංචි විශ්‍රාමික සංගම් ගොනු 381 සහ සංගම් නාම ලේඛණය නඩත්තු කිරීම,සංගම් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වාගැනිම.
4. සේවාලාභීන් විසින් ඉදිරිපත් කල විමසීම් ලිපි 265 ට පිළිතුරු ලිපි යැවීම.

| සේවාලාභින් සම්බන්ධ වු ආකාරය | සංඛ්‍යාව |
|---|---|
| 01 .පුද්ගලයින් පැමිණ ඉදිරිපත් කළ විමසිම් මෙහෙය විම. | 33591 |
| 02 . 1970 කෙටි දුරකතන සේවය මගින් ඉදිරිපත් කළ විමසිම් මෙහෙය විම. | 33533 |
| 03.විශ්‍රාමික සංගම් සම්බන්ධිකරණය. | 381 |
| 04. ලිපි මඟින් කළ විම්සිම් සඳහා පිළිතුරු යැවිම. | 265 |

## ලියාපදිංචි ශාඛාව

ප්‍රධාන ක්ෂේත්‍රයන් සිවිල්, අධිකරණ සහ සන්නද්ධ හමුදා සේවයේ විශ්‍රාම යන නිලධාරීන් ලියාපදිංචි කොට ස්ථිර විශ්‍රාම වැටුප් අංක නිකුත් කර දීප ව්‍යාප්ත විශ්‍රාම වැටුප් ගෙවීමේ ජාලය සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වගකීම් භාරය ඉටු කිරීම.


අංශයේ නිමවුම අයදුම් පත්‍ර ලියාපදිංචි කර අංක ලබා දීම.




## ශාඛාවේ ප්‍රධාන කර්තව්‍යයන්

- විශ්‍රාමිකයන් ලියාපදිංචි කිරීම.
- සේවා පාරිතෝෂිත ගෙවීම ලියාපදිංචි කිරීම.
- මරණ පාරිතෝෂිත ගෙවීම ලියාපදිංචි කිරීම.
- විශ්‍රාම වැටුප ගෙවීමට පෙර මියගිය නිලධාරීන්ගේ උරුමකරුවන්ට ගෙවීම ලියාපදිංචි කිරීම.
- සංශෝධන ගෙවීම ලියාපදිංචි කිරීම.
- දීමනා ගෙවීම ලියාපදිංචි කිරීම.
- ලැබෙන දෛනික තැපෑල ශාඛා අතර බෙදා හැරීම.
- දෙපාර්තමේන්තුවෙන් පිටතට ලැබෙන ලිපි මධ්‍යම තැපැල් හුවමාරුවට භාරදීම.
- සිවිල් විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර හා විමධ්‍යගත කිරීමට පෙර විශ්‍රාම වැටුප් ගොනු ගබඩා කිරීම හා පවත්වා ගෙන යාම.
- සියලු විදේශ විශ්‍රාම වැටුප් ගොනු ගබඩා කර තැබීම හා පවත්වා ගෙන යාම හා එම දත්ත පාදය පවත්වා ගෙන යාම.


## කාර්යය විහිදුම




තැපැල් ශාඛාවෙන් අයදුම් පත්‍ර ලබා ගැනීම
අයදුම්පත් පරීක්ෂා කිරීම
අයදුම්පත් නිවැරදි
නැත
අඩුපාඩු සඳහන් කර නිවැරදිව එවන ලෙස දන්වා අදාළ ආයතනය වෙත ආපසු යැවීම
ඔව්
ලියාපදිංචි අංකයක් ලබා දීම
අයදුම්පතේ තොරතුරු පරිගණක පද්ධතියට ආදානය කිරීම
ලියාපදිංචි අංක දැනුම් දීමේ ලිපි මුද්‍රණය කිරීම හා බෙදාහැරීම
පිටපත 1
මුල්
පිටපත 2
පිටපත 3
ගිණුම්/ගණන් බැලීම්/සන්නද්ධ සේවා ශාඛාවට
අදාළ ආයතනය වෙත
විශ්‍රාමිකයා/ අයදුම්කරු
කාර්යාල පිටපත
තැපැල් ශාඛාවට

ඉහත ක්‍රියාවලිය තුළින් ලියාදිංචි ශාඛාවේ 2012 වර්ෂය තුළ නිමවුම පහත පරිදි වේ.

**2012 වර්ෂය තුළ ලියාපදිංචි කල අයදුම්පත් සංඛ්‍යාව**




**2012 වර්ෂය තුළ ලියාපදිංචි කල සංශෝධන අයදුම්පත් සංඛ්‍යාව**



## තොරතුරු තාක්ෂණ ශාඛාව

**තොරතුරු තාක්ෂණ ශාඛාව** 2012 වර්ෂය තුළ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරන ලද අතර පහත සඳහන් කාර්යයන් ඊට පැවරුණි.

## කාර්යභාරය

- තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම.
- දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය කළමනාකරණය සහ පරිපාලනය කිරීම.
- දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ සම්පත් තිරසාරව කළමනාකරණය සහ පරිපාලනය කිරීම.
- ශ්‍රී ලංකා රාජ්‍ය ජාලය හා සම්බන්ධ දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය පරිපාලනය හා එම ජාලය යාවත්ව පවත්වාගෙනයාම.
- දෙපාර්තමේන්තුවේ දත්ත මූලය පරිපාලනය, ක්‍රමානුකූල උපස්ත පිටපත් පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුවේ ඉ - විශ්‍රාම වැටුප් පරිගණක පද්ධතිය පරිපාලනය සහ අඛණ්ඩ ක්‍රියාකාරීත්වයෙන් යුතුව පවත්වාගෙන යාමට කටයුතු සම්පාදනය.
- ලංකා රාජ්‍ය ජාලයේ උපකාරක සේවය හා දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ සම්බන්ධීකරණය.

**2012 වසරේ තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා ක්‍රියාකාරකම්හි ප්‍රගතිය**

1. **ඉ - විශ්‍රාම වැටුප් ක්‍රමය රාජ්‍ය ආයතන වලට හඳුන්වා දීම.**

**දිස්ත්‍රික්ක 14ක් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 182 ක සිදු කළ පුහුණු වැඩසටහන්**

- ඉ - විශ්‍රාම වැටුප් හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් ගණන 14
- ඉ - විශ්‍රාම වැටුප් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ගණන 14
- පුහුණුව ලද නිළධාරීන් ගණන 704

**රාජ්‍ය ආයතන 06 ක සිදු කළ පුහුණු වැඩසටහන්**

- ඉ - විශ්‍රාම වැටුප් හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් ගණන 06
- ඉ - විශ්‍රාම වැටුප් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ගණන 04
- පුහුණුව ලද නිළධාරීන් ගණන 130

2. **ප්‍රාදේශීය ලේකම් කාර්යාල - දත්ත සංක්‍රමණය කිරීමේ පුහුණු වැඩසටහන් හා උපදේශන වැඩසටහන්**

**දිස්ත්‍රික්ක 25 ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් තුළ සිදුකළ පුහුණු වැඩසටහන්**

- **දත්ත සංක්‍රමණය කිරීමේ** පුහුණු වැඩසටහන් ගණන 25
- **අධීක්ෂණ හා පසු විපරම්** වැඩසටහන් 22

## සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය

සන්නද්ධ හමුදා අංශයෙහි ප්‍රධාන කාර්ය භාරය ලෙස සිවිල් පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සකස් කර දීම ප්‍රධාන වේ .

මෙම අංශයෙන් පහත සඳහන් විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කාර්යයන් ඉටු කරනු ලැබේ


- සේවා විශ්‍රාම වැටුප්.
- සේවා පාරිතෝෂික දීමනා
- දුබලතා විශ්‍රාම වැටුප්.
- යැපෙන්නන්ගේ දීමනාව
- මරණ පාරිතෝෂිකය
- විශේෂ වන්දි
- වන්දි විශ්‍රාම වැටුප්.
- ස්වේච්ඡා බලසේනා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්
- පුන්‍යාධාර දීමනා
- දෛනික සේවා/කරුණා සහගත දීමනා

### සිවිල් හා අධිකරණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුරූපිව ඉටුකරන ලද හිමිකම් ප්‍රදාන

ලැබුණු ලිපිගොනු සංඛ්‍යාව

වැඩ අවසන් ලිපිගොනු සංඛ්‍යාව


සංඛ්‍යා




ලිපිගොනු නාමය

**යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථාසංග්‍රහය / වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්)සන්නද්ධ බල සේනා (පනතට අනුව ඉටුකරන ලද හිමිකම් ප්‍රදාන**


සංඛ්‍යා




ලිපිගොනු නාමය

## වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අංශය

“ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබූ රජයේ සේවකයෙකුගේ / සේවිකාවකගේ, වැන්දඹුව, වැන්දඹු පුරුෂයා, අනත්දරුවන්ට හා ආබාධිත දරුවන්ට ආර්ථික වශයෙන් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා වැන්දඹු අනත්දරු පනත් මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන තුල ප්‍රතිලාභ සලසාදීම මෙම අංශයේ කාර්යභාරයයි.”




### වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම් කිරීමේ නීතිමය පසුබිම

1898වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්

→ 1906වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
- වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය

**වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සඳහා අදාල කරගනු ලබන පනත් සංශෝධන**

- 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත
- 1981 අංක 44 දරණ සංශෝධන පනත
- 1998 අංක 57 දරණ සංශෝධන පනත
- 1998 අංක 64 දරණ සංශෝධන පනත
- 2010 අංක 08 දරණ සංශෝධන පනත

**වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සඳහා අදාල කරගනු ලබන පනත් සංශෝධන**

- 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත
- 1985 අංක 19 දරණ ( සංශෝධන ) පනත
- 1997 අංක 16 දරණ ( සංශෝධන ) පනත
- 1998 අංක 56 දරණ සංශෝධන පනත
- 1998 අංක 65 දරණ සංශෝධන පනත
- 2001 අංක 02 දරණ සංශෝධන පනත
- 2010 අංක 09 දරණ සංශෝධන පනත

## අංශයේ කාර්ය භාරය

- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයා  වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු  ක්‍රමය යටතේ ලියාප කිරීම
- සිවිල් වැන්දඹු ගොනු යාවත්කාලීන කිරීම.
- දායක මුදල් රැස් කිරීම හා ආපසු ගෙවීමේ කටයුතු.
- සිවිල් හා පළාත් පාලන අනත්දරු ගැටළු විසඳීම.
- සිවිල් හා පළාත් පාලන ආබාධිත විශ්‍රාම වැටුප් කටයුතු.
- සිවිල් හා පළාත් පාලන වැන්දඹු ගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවීම් කිරීම සඳහා ෙ කිරීම.
- වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු ලිපිගොනු ලේඛනාගාර ගත කිරීම.
- පළාත් පාලන විශ්‍රාම වැටුප් ගොනු අංක, සිවිල් විශ්‍රාම වැටුප් අංකවලට මාරු කිරීම.

**වැන්දඹු/වැන්දඹු පුරුෂ සමාජිකත්වය ලබා දීම.**

| | 2011 වර්ෂය | 2012 වර්ෂය |
|---|---|---|
| වසර ආරම්භයේ සාමාජික සංඛ්‍යාව | 991627 | 1045168 |
| වසරේ ලියාපදිංචි කරන සාමාජික සංඛ්‍යාව | 53541 | 37913 |
| වසර අවසාන වන විට සාමාජික සංඛ්‍යාව | 1045168 | 1077081 |

සමාජිකත්වය ලබා දීමේදී, රාජ්‍ය දෙපාර්තමේන්තු හා අමාත්‍යංශ මඟින් ලැබෙන ඉල්ලීම් වලට අමතරව දිවයින පුරා ජංගම සේවා පැවැත්වීම මඟින් කඩිනම් ලියාපදිංචි කිරීම් සිදුකල අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ජංගම සේවාව පැවත්වූ ස්ථානය | ලියාපදිංචි කල සංඛ්‍යාව |
|---|---|
| දැයට කිරුළ ප්‍රදර්ශනය 2012 | 141 |
| කලාප අධ්‍යාපන කාර්යාලය, නුවරඑළිය | 881 |
| ඌව පළාත් අධ්‍යාපන ,හාලිඇල | 886 |
| පොලිස් දෙපාර්තමේන්තුව,දකුණ පළාත | 887 |
| පොලිස් දෙපාර්තමේන්තුව,මධ්‍යම පළාත | 1004 |
| පොලිස් දෙපාර්තමේන්තුව,ඌව පළාත | 850 |
| පොලිස් දෙපාර්තමේන්තුව, උතුරු පළාත | 666 |
| කලාප අධ්‍යාපන කාර්යාලය,ගම්පහ | 384 |
| මුළු එකතුව | 5699 |


## මුදල් රැස් කිරීම හා කළමනාකරණය

රජයේ සේවක සේවිකාවන්ගේ වැටුපෙන් %6හා %7බැගින් අයකරනු ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් පහත පරිදි රැස්කර දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම පවත්වාගෙන යාම .

## 2012 වසරේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් රැස් කිරීම


| | | |
|---|---|---|
| මධ්‍යම රජයේ ආදායම | රුපියල් මිලියන | 8335.77 |
| පළාත් සභා ආදායම | රුපියල් මිලියන | 3405.14 |
| රැස් කරන ලද මුළු ආදායම | රුපියල් මිලියන | 11740.97 |

රුපියල් මිලියන




විශ්‍රා
ම වැටුප් පාරිතෝෂික හා මරණ පාරිතෝෂික ගෙවීම් සඳහා අක්මුදල් වශයෙන් මෙම වසර තුල මුදාහරින ලද මුළු මුදල රුපියල් මිලියන 3441ක් වන අතර දායක මුදල් ආපසු ගෙවීම සඳහා මිලියන 139ක් භාවිතා කර ඇත.

## දායක මුදල් උපයෝජනය(රුපියල් මිලියන)





2012.12.31 දිනට ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදාලව ආයෝජන

) 2012.12.31 දිනට ආයෝජන ශේෂය(

| | | |
|---|---|---|
| ශ්‍රි ලංකා මහ බැංකුව | රුපියල් | 2,397,590.00 |
| ජාතික ඉතිරි කිරිමේ බැංකුව | රුපියල් | 427,180,446.03 |

## ගුරු වැන්දඹු අනත්දරු අරමුදල ආයෝජන




ආ
බා
ධිත
දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම

“සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණමණ්ඩලයක් විසින් අනත්දරුවකුට ඔහුගේ ජීවනෝපාය සලසාගැනීමට නොහැකිවන්නාවූ ශාරීරික හෝ මානසික ආශක්‍යතාවයකින් පෙළෙන බවට තීරණය කළවිට ඒ අනත්දරුවාට වයස නොතකා යාව ජීව විශ්‍රාම වැටුපක් ලැබීමට ප්‍රතිපාදන සලසාඇත.”

ආබාධිත විශ්‍රාම වැටුප් අයදුම්කරුවන්

අයදුම්පත්‍රය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



මූලික පරීක්ෂණයේ කම්ටු වාර්තාව සහ ඊට අදාළ ප්‍රාදේශීයලේකම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වෛද්‍ය මණ්ඩලය

වෛද්‍ය මණ්ඩල අනුමැතිය ලත්




ප්‍රතික්ෂේපිත අයදුම්පත්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමැතිය



ගෙවීම් කිරීමට ගොනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත

**වැන්දඹු /වැන්දඹුපුරුෂලිපිගොනු කළමනාකරණය**

| කාර්යය | වසර තුළ නිමකළ ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|
| වැන්දඹු/වැන්දඹු පුරුෂ ලිපිගොනු යාවත්කාලීන කිරීම | 23589 |
| සිවිල් හා පළාත් පාලන වැන්දඹු ,වැන්දඹු පුරුෂ වැන්දඹු අනත්දරු ගැටළු විසඳීම | 1010 |
| වැන්දඹු/වැන්දඹුපුරුෂලිපිගොනු ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම | 5976 |
| වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු ලිපි ගොනු පිළියෙල කොට ලේඛණාගාරගත කිරීම | 63600 |

## ප්‍රතිපත්ති අංශය

රජයේ විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සම්පාදිතව පවත්තා ප්‍රතිපත්තිමය කරුණු අර්ථ දැක්වීම, අවස්ථානුකූලව එලෙස පවතින ප්‍රතිපත්තිමය කරුණු සංශෝධනය කිරීම හා නව ප්‍රතිපත්ති තීරණ වලට එළඹීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. තවද රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සාපේක්ෂ වශයෙන් සාධාරණ මට්ටමකට පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සැකසීම ද ප්‍රධාන වගකීමකි.

## මූලික කාර්යයන්

- ව්‍යවස්ථාපිත සංශෝධන සඳහා අදාල වන්නාවූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා ගැසට් නිවේදන නිකුත් කිරීම.
- විශ්‍රාමික ප්‍රජාව පෞද්ගලිකව ද සියළුම රාජ්‍ය ආයතන මට්ටමින් ද යොමු කරනු ලබන ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම්/ උපදෙස් සැපයීම.
- සමස්ථ විශ්‍රාම වැටුප් ගෙවීම් ජාලය පවත්වාගෙන යාමේදී අදාල වන්නාවූ සියළු අණපනත්, චක්‍රලේඛ, ගැසට් නිවේදන යනාදී ලිපි ලේඛණ ඇතුළත් තොරතුරු පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.


| | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|---|
| 01 | 2012- 02- 03 | 10/2011 (සංශෝධන I) | 2011 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් හා දීමනා සංශෝධනය කිරීම |
| 02 | 2012- 02- 06 | 09/2004 සංශෝධන (III) | විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීමේ නව ක්‍රමය |
| 03 | 2012- 02- 08 | 01/2012 | පළාත් පාලන විශ්‍රාම වැටුප් මාසික ගෙවීම් ලේඛණ පිළියෙල කිරීම සහ ලිපිගොනු භාරකාරත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍ය ගත කිරීම |
| 04 | 2012- 02- 29 | 02/2012 | වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය පලකිරීම/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම/ සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන් වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමේ කාලසීමාව දීර්ඝ කිරීම. |
| 05 | 2012- 05- 24 | 03/2012 | විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම (12 ලක්ෂ කාණ්ඩය ආරම්භ වීම) |
| 06 | 2012- 05- 28 | 10/2011 (සංශෝධන 02) | 2011 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් හා දීමනා සංශෝධනය කිරීම. |
| 07 | 2012- 06- 22 | 06/2011 (සංශෝධන 01) | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාසංග්‍රහයේ "ට "උපලේඛණය අර්ථ කතනය කිරීම. |
| 08 | 2012- 07- 25 | චක්‍රලේඛ ලිපි 04 | පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් /වැන්දඹු අනත්දරු හිමිකම් ප්‍රදානය කිරීම. |

## නීති අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමේදී පැනනගින ගැටළු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් කරමින් ඉදිරිපත් කර ඇති නඩු වලට නිරීක්ෂණ සැපයීම සඳහා නීති අංශය ස්ථාපිත කර ඇත.

## ඉටු කෙරෙන කාර්යයන්

- දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පවත්නා සියලූම නෛතික කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- විශ්‍රාම වැටුප් වලට අදාල සියලූම අණ පනත් සංශෝධන කෙටුම්පත් කටයුතු සඳහා සහාය වීම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව වෙතින් යොමු කරනු ලබන ගැටලු වලට පිළිතුරු සැපයීම්දී අවශ්‍ය වන නීතිමය සහාය ලබාදීම.
- මානව හිමිකම් කොමිෂන් සභාව සහ පරිපාලන කටයුතු පිළිබද පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් වලට පිළිතුරු සැපයීම සහ පරීක්ෂණ සඳහා සහභාගී වීම.
- අල්ලස් හා දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණ සඳහා සහභාගී වීම සහ අවශ්‍ය වාර්තා සකස් කිරීම.
- නීති අංශයට පැමිණෙන විශ්‍රාමිකයින්ගේ ගැටළු වලට අදාල නීති උපදෙස් සැපයීම.






නීති අංශයට සම්බන්ධ ආයතන පද්ධතිය

## පෙනී සිටි පරීක්ෂණ ප්‍රමාණය


අධිකරණ

මානවහිමිකම්

ඔම්බුඩ්ස්මන්


පාර්ලිමේන්තුඋපදේශකකාරකසභාව

මහජනපෙත්සම්කාරකසභාව



### නිකුත් කල වාර්තා ප්‍රමාණය

| | |
|---|---|
| අධිකරණ | 18 |
| මානවහිමිකම් | 79 |
| ඔම්බුඩ්ස්මන් | 17 |
| පාර්ලිමේන්තුඋපදේශකකාරකසභාව | 25 |
| මහජනපෙත්සම්කාරකසභාව | 50 |
| වෙනත් | |



## පාලන හා පුහුණු අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ වෙනුවෙන් සක්‍රිය දායකත්වය ලබා දෙන දිවයින පුරා විසිරී සිටින විශ්‍රාම වැටුප් ගෙවීම් ජාලයට සම්බන්ධ සමස්ත කාර්ය මණ්ඩලය කළමනාකරණ, අභිප්‍රේරණය හා පුහුණු කිරීම ඇතුළු මානව හා භෞතික සම්පත් කළමනාකරණ කාර්යභාරය පැවරී ඇත්තේ පාලන හා පුහුණු අංශයටය.ඒ සඳහා දීපව්‍යාප්ත විශ්‍රාම වැටුප් ගෙවීම් විධිමත්ව හා වඩා කාර්යක්ෂමව පවත්වා ගනු වස් මානව සම්පත මෙහෙයවීම හා පාලනය කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

## පුහුණු පන්ති හා වැඩමුළු සංවිධානය කිරීම

විශ්‍රාම වැටුප් විෂයෙහි සිදුවූ පරිවර්තනාත්මක වෙනස්කම් සැලකිල්ලට ගෙන 2012 වසරේදී ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය ආයතන වල නිළධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු පවත්වන ලදී. පෙර වසරවල පුහුණු  වැඩමුළු වලින් ලද අත්දැකීම් පදනම් කරගෙන නවතාවයකින් සැකසූ විෂය ධාරාව තුළින් ප්‍රබල කාර්යක්ෂමතාවයක් විශ්‍රාම වැටුප් සැකසීමේදී හා ගෙවීමේදී රාජ්‍ය ආයතන තුළ වර්ධනය කරමින් නිළධාරීන් පුහුණු කරවීමට 2012 වසරේදී ද හැකිවිය. මෙම ප්‍රවණතාවය කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු දිවයිනේ සෑම දිශාවකම දීපව්‍යාප්තව දක්නට ලැබිණි.පුහුණු වැඩසටහන් වල ඇති සාර්ථකත්වය ඒ සඳහා ඇති ඉල්ලුමෙන් සනාථ වේ. මෙම කාර්යය සපුරා ගැනීමෙහිලා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සුවිශේෂ පරිශ්‍රමයක් දරන ලද බව ද මෙහිලා සඳහන් කරනු වටී.

2012 වසරේදී දින 73ක් පුරා වැඩමුළු 34 ක් පවත්වමින් එම ආයතන වල නිළධාරීන් 2000කට ආසන්න පිරිසක් වෙත  විශ්‍රාම වැටුප් විෂයට අදාල පුහුණුව ලබා දී ඇත. එමෙන්ම රාජ්‍ය සේවා පුහුණු ආයතන මඟින් එම වසර පුරා සංවිධානය කරන ලද විශ්‍රාම වැටුප් පුහුණු වැඩමුළු සඳහා ද සම්පත් දායකයින් යෙදවීම ද සිදු කර ඇත.

## විදේශ විශ්‍රාම වැටුප් අංශය

### අරමුණ

විදේශගත ශ්‍රී ලාංකේය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නිරවද්‍යතාවයෙන් යුතුව ගෙවීම.

### කාර්යභාරය

- විවිධ රටවල වාසය කරන ශ්‍රී ලාංකේය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ,වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් හා යාවත් කාලීන කිරීමේ කටයුතු
- දූත මණ්ඩල කාර්යාලයක බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කරන ලද වාර්ෂික ජීවිත සහතිකයක් ලබා ගැනීමෙන් අනතුරුව විදේශගත සියලු විශ්‍රාමිකයන්ගේ ඉහත ගෙවීම් කැනඩාව , ඕස්ට්‍රේලියාව ,ඇමරිකාව ,මහා බ්‍රිතාන්‍ය ,ඉන්දියාව ,නවසීලන්තය යන රටවල පිහිටි ශ්‍රී ලාංකේය දූත මණ්ඩල කාර්යාල මඟින් හෝ ලංකාවේ විශේෂ බැංකු ඒකක )ලංකා බැංකුව -අගනුවර ශාඛාව , මහජන බැංකුව -රැජින ශාඛාව ,පෑන් ඒෂියා බැංකුව -බොරැල්ල ශාඛාව (මඟින් සිදු කිරීම .
- විදේශගත විශ්‍රාමිකයන් නැවත ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචියට පැමිණි පසු ඒ බව තහවුරු කරගෙන මෙරට පදිංචි විශ්‍රාමිකයකු ලෙස සලකා ගෙවීම් සිදු කිරීම සඳහා ලිපි ගොනු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයයන් වෙත යොමු කිරීම.
- අදාළ චක්‍රලේඛයන්ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධන කටයුතු කිරීම.

විදේශගත ශ්‍රී ලාංකේය විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී ඔවුන්ට ශ්‍රී ලාංකේය පුරවැසිභාවය හෝ ද්විත්ව පුරවැසිභාවය තිබීම අත්‍යවශ්‍ය සාධකයක් නොවේ .වෙනත් රටක පුරවැසිභාවය ලබා ගත් පුද්ගලයකු වුවද ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නේ නම් ඔහු වෙත විශ්‍රාම වැටුප් ගෙවීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.


විදේශ දූත මණ්ඩල හා විශේෂිත බැංකු ගිණුම් මඟින් ගෙවන ලද සමස්ත විශ්‍රාම වැටුප් මුදල 2012.12.31 -දිනට

| ගෙවන ලද ආයතනය | විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| විදේශ දූත මණ්ඩල | 2378 | 426,474,107.30 |
| විශේෂිත බැංකු ගිණුම් | 4330 | 897,127.108.75 |

තවද 2011වසරේදී නිකුත් කරන ලද 2011/5දරණ චක්‍රලේඛය තව දුරටත් ක්‍රියාත්මක කරමින් 2012වසරදී ද විදේශය දූත මණ්ඩල මගින් ගෙවීම් සිදු කිරීම සීමා කිරීමෙන් විශ්‍රාමිකයන් විශාල ප්‍රමාණයක් තම විශ්‍රාම වැටුප් දේශීය බැංකු මඟින් ලබා ගැනීමේ නැඹුරුවට යොමු කිරීමේ හැකියාව ලැබී ඇත.

**විශ්‍රාම වැටුප් ගෙවීම්2012 -**


විශ්‍රාමිකයන්
සංඛ්‍යාව





මාසය

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල


1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනත යටතේ 1942.04.01 දින මාසික වැටුප් ලබන ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයන් සඳහා සේවා අවසාන මූල්‍ය ප්‍රතිලාභ සහතික කරනු වස් ආරම්භ කරන ලද අතර 2003 අංක 17 දරණ සංශෝධන පනත මඟින් අරමුදලේ අරමුණු හා පරමාර්ථ තවදුරටත් පුළුල් කරන ලදී. අරමුදලේ පාලනය පංච පුද්ගල මණ්ඩලයක් මඟින් සිදුකරනු ලබන අතර එහි ව්‍යුහය පහත පරිදි වේ.



අරමුදලේ කාර්යයන් පහත පරිදි පෙන්නුම් කල හැක.



**දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය**






## ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලිය






| | |
|---|---|
| 14 වගන්තිය | - අනිවාර්ය දායක මුදල + පොලිය සහ රජයේ ප්‍රසාද මුදල + පොලිය |
| 16 වගන්තිය | - අනිවාර්ය දායක මුදල + පොලිය |
| 20 වගන්තිය | - අනිවාර්ය දායක මුදල + පොලිය |
| සදොස් | - අනිවාර්ය දායක මුදල |

අරමුදලේ සම්පත් ආයෝජනයෙන් වර්ෂය තුළ ඉපැයු මුළු පොලී ආදායම රුපියල් මිලියන 2,571 ක් වු අතර, අරමුදලේ පාලන වියදම වු රුපියල් මිලියන 10.7 ක් අයකිරීමෙන් අනතුරුව රුපියල් මිලියන 2,560.33 ක් දායකයින්ටවිසර්ජන කිරීම සඳහා ඉතිරි වු අතර, ඉන් 8.6% ක පොලියක් ලැබෙන පරිදි රුපියල් මිලියන 2,545.49 ක් විසර්ජනය කර ඉතිරි වූ මුදල වන රුපියල් මිලියන 26.9 ක් පොදු සංචිත ගිණුමට මාරු කරන ලදී. වර්ෂය තුල අරමුදල් ආපසු ලබාගැනීමට ඉදිරිපත් වූ අයදුම්පත්‍ර 6997 න් 98% ක් සඳහා ප්‍රතිලාභ ලබා දෙන ලදි





දායක මුදල් ලැබීම් සහ ගෙවීම් (රු.මිලියන)
2,000.00
1,800.00
1,600.00
1,400.00
1,200.00
1,000.00
800.00
600.00
400.00
200.00
-
රුපියල් මිලියන
2000 2001 2002 2003 2004 2005 2006 2007 2008 2009 2010 2011 2012
වර්ෂය
දායක මුදල් ලැබීම්
දායක මුදල් ගෙවීම්


2012 වර්ෂය තුල දායක මුදල් ලැබීම් සහ ගෙවීම් (රුපියල්)
300,000,000.00
250,000,000.00
200,000,000.00
150,000,000.00
100,000,000.00
50,000,000.00
-
රුපියල්
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝම්බර්
නොවැම්බර්
දෙසැම්බර්
මාසය
දායක මුදල් ගෙවීම්
දායක මුදල් ලැබීම්




ආයෝජන ( රු. මිලියන )
35,000.00
30,000.00
25,000.00
20,000.00
15,000.00
10,000.00
5,000.00
-
රු. මිලියන
2000
2001
2002
2003
2004
2005
2006
2007
2008
2009
2010
2011
2012
වර්ෂය

2012 වර්ෂයේ ආයෝජන (රුපියල් )
2,500,000,000.00
2,000,000,000.00
1,500,000,000.00
1,000,000,000.00
500,000,000.00
-
රුපියල්
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝම්බර්
නොවැම්බර්
දෙසැම්බර්
මාසය
ආයෝජන කල්පිරීම්
ආයෝජන පොලී ලැබීම්
නව ආයෝජන

## අභ්‍යන්තර විගණන අංශය


විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අරමුනු හා ඉලක්ක සාක්සාත් කර ගැනීමට ඉහළ කළමනාකරණයට සහාය ලබා දීම සඳහා වාර්ෂික ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ඵලදායි සහකාර්යක්ෂම ලෙසත් අණපනත්,නීති රීති, රෙගුලාසි වලට අනුකූලව සිදු කරන්නේද යන්න, පරීක්ෂ කිරීම සඳහා විශ්‍රාම වැටුප් හා සම්බන්ධ රාජ්‍ය ආයතන ජාලය විගණනය කිරීම අභ්‍යන්තර විගණන අංශයේ අරමුණු වේ.



## ප්‍රධාන කාර්ය භාර්ය

- ➢ විශ්රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් සම්බන්ධ ආයතන විගණන පරීක්ෂාවට ලක් කර විගණන විමසුම් නිකුත් කිරීම.
- ➢ මහජන පෙත්සම් සම්බන්ධ කටයුතු කිරීම.
- ➢ විශේෂ පරීක්ෂණ
- ➢ විශ්රාමික අභියාචනා/ඉල්ලීම සම්බන්ධ කටයුතු කිරීම.
- ➢ ගැටලු සහිත ලිපිගොනු සදහා අවශය උපදෙස් /නිරීක්ෂණ ලබාදීම.
- ➢ රජයේ විගණන අංශය /රාජ්‍ය පරිපාලන අභ්‍යන්තර විගණන අංශය මගින් ලැබෙන විගණන විමසුම් සදහාවිශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අංශ සම්බන්ධ කර පිළිතුරු සැපයීම.
- ➢ ප්රාදේශිය ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවේ අංශ මගින් පරීක්ෂා කිරීම සහ සකස් කරදීම සඳහා ලැබෙන ලිපි ගොනු සම්බන්ධ උපදෙස් ලබා දීම.


### විශ්‍රාම වැටුප් සකස් කිරීම හා ගෙවීම සම්බන්ධ විගණනයට ලක් කළ යුතු රාජ්‍ය ආයතන ජාලය




- විශ්‍රාම වැටුප් විගණන කාර්ය සඳහා යොදවන සීමිත මානව සම්පත් උපයෝජනයක් තුළින් ප්‍රාදේශීය ලේකම් කාර්යලයන්හි විශ්‍රාම වැටුප් විගණනයට වැඩි අවදානයක් යොමු කරනු ලැබීය.


මුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන 330 කි. 2012 වර්ෂයේ විගණනයට ලක් කළ - 109

| 2012 වර්ෂය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන |
|---|---|
| විගණනයලක්කළ | 109 |
| විගණනයට ලක් නොවූ | 221 |
| එකතුව | 330 |



## විශ්‍රාම වැටුප් සම්බන්ධ විගණන පරීක්ෂණ ක්‍රියාවලිය




---

### 2012 වර්ෂයේ ප්‍රගතිය

| කාර්ය | ප්‍රගතිය |
|---|---|
| 1. විගණනයට ලක් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 109 |
| | |
| 2. වෙනත් කාර්යාල | 35 |
| | |
| 3. විශේෂ පරීක්ෂණ | 04 |
| | |
| 4. පිළිතුරු යවන ලද විගණන විමසුම් | 33 |
| | |
| 5. කටයුතු කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව | 288 |
| | |
| 6. පරීක්ෂා කරන ලද ලිපිගොනු සංඛ්‍යාව | 238 |

## පළාත් පාලන ඒකකය

පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය මගින් අරමුදල් 3 ක් පවත්වාගෙන යනු ලැබේ.

1. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල
2. පළාත් පාලන සේවා වැන්දඹු හා පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
3. පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
   වැටුප් ගෙවීම් කටයුතු විමධ්‍යගත කර ඇත.ඒ අනුව සියළුම පළාත් පාලන විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු
   01/ 2012 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව 2011.01.01 දින සිට සියළුම පළාත් පාලන විශ්‍රාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුවේ.

දැනට පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකයට අදාල ආයෝජන හා විශ්‍රාම වැටුප් දායකත්වය පහත පරිදි වේ.

1. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල
   2012.12.31 දිනට විශ්‍රාම වැටුප් දායකත්වය = රු. 93,900,000.00

2. පළාත් පාලන සේවා වැන්දඹු හා පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
   **2012.12.31*දිනට ආයෝජන***

   භාණ්ඩාගාර බැඳුම්කර = රු. 324,723,431.51

   රුපියල් ණය = රු. 98,260,000.00

   2012.12.31 දිනට විශ්‍රාම වැටුප් දායකත්වය = රු. 3,196,199.40

3. පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

   **2012.12.31*දිනට ආයෝජන***

   භාණ්ඩාගාර බැඳුම්කර = රු.118,283,917.23


   රුපියල් ණය = රු. 22,800,000.00

   2012.12.31 දිනට විශ්‍රාම වැටුප් දායකත්වය =රු. 4,000,000.00

## ගිණුම් අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය සම්පත් වඩා කාර්යක්ෂම හා ඵලදායී අයුරින් පවත්වා ගෙන යාම සඳහා විධිමත් වූ ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා දායකත්වය සැපයීම මෙම අංශය මගින් සිදු කරයි .

මෙම කර්තව්‍ය ගිණුම් අංශයේ ඒකක හතරක් මගින් ඉටු කරනු ලබයි .




01. **ගිණුම් ඒකකය**

- වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයකට අවශ්‍ය සැලසුම් පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් ඇතුළු සියළුම ගෙවීම් සඳහා අවශ්‍ය අත් මුදල් ලබා ගැනීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන හා අත්මුදල් ලබා දීමේ සම්බන්ධීකරණ කටයුතු හා පසු විපරම් කටයුතු.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු.
- රාජ්‍ය ගිණුම්කරණයට අදාළ වන්නා වූ දෙපාර්තමේන්තු දත්තයන් මාසිකව භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම සහ වාර්ෂික විසර්ජන ගිණුම ඇතුළු සියළුම ගිණුම් ඉදිරිපත් කිරීම.

## 2012 වර්ෂයේ මූල්‍ය තොරතුරු හා ප්‍රගතිය

2012 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තු වලින් වෙන්වී ඇති මුළු ප්‍රතිපාදන ව්‍යාපෘතියට අනුව බෙදී ඇති ආකාරය පහත පරිදි වේ.


| | රු. |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | 78,286,645 |
| විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම | 126,727,152,155 |
| | 126,805 438,800 |

ඉහත ප්‍රතිපාදනය මූල්‍යකරණය කරනුයේ,


| | |
|---|---|
| දේශීය අරමුදල් මඟින් (11) | 105,675 ,438 ,800 |
| විශේෂ නීති සේවා (21) | 21,130,000,000 |
| | 126,805 ,438 ,800 |

| | වෙන් කරන ලද ප්‍රතිපාදන)රු .මිලියන( | වියදම (රු. මිලියන) | විශ්‍රාම ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|
| ආබාධිත සෙබළුන්ගේ සමාජ ආරක්ෂණ කටයුතු | 14,779.00 | 14,779.00 | 99.99 |
| රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා අනෙකුත් ගෙවීම් | 90,570.00 | 90,565.00 | 99.99 |
| | | | 100 |

විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ප්‍රතිපාදන හා වියදමපහත පරිදි වේ.




# පාරිතෝෂික ගෙවීමේ ක්‍රියාවලිය



# මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය



# විශ්‍රාමික ප්‍රතිලාභීන්ගේ වර්ධනය



# විශ්‍රාමික ප්‍රතිලාභීන් දිස්ත්‍රික් අනුව බෙදී ගොස් ඇති ආකාරය -2012-

| *දිස්ත්‍රික්කය* | *විශ්‍රාමිකයන් ගණන* |
|---|---|
| අනුරාධපුර | 20037 |
| බදුල්ල | 17871 |
| කොළඹ | 85574 |
| විදේශ විශ්‍රාම | 6708 |
| ගාල්ල | 29933 |
| ගම්පහ | 76992 |
| හම්බන්තොට | 9694 |
| කළුතර | 36076 |
| නුවර | 44777 |
| කෑගල්ල | 23903 |
| කුරුණෑගල | 42860 |
| මාතලේ | 12017 |
| මාතර | 20392 |
| මොණරාගල | 6414 |
| නුවර එළිය | 7982 |
| පොළොන්නරුව | 6950 |
| පුත්තලම | 12092 |
| රත්නපුර | 16091 |
| යාපනය | 14685 |
| වව්නියාව | 2392 |
| ත්‍රිකුණාමලය | 5210 |
| මන්නාරම | 1049 |
| කිලිනොච්චිය | 765 |
| මුලතිව් | 524 |

| | |
|---|---|
| මඩකලපුව | 6615 |
| අම්පාර | 6981 |
| එකතුව | 514584 |

## 02. ගෙවීම් ඒකකය


දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා ණය ගෙවීමත්, දෙපාර්තමේන්තු කටයුතුවලට අවශ්‍ය අත්තිකාරම් ලබා දීම හා සියලුම නිලධාරින්ගේ අතිකාල ගමන් වියදම් ගෙවීමත්, මෙම අංශය මගින් ඉටුකරයි.

2012 වර්ෂය තුලදී ගෙවීම් ඒකකය මඟින් සිදුකරන ලද වියදම් විස්තර පහත පරිදි වේ.

01. වැටුප් හා දීමනා රු .218,518,226

02. අතිකාල ,ගමන්, හා වෙනත් දීමනා රු17 .,263,246

03. දේපළ ණය ගෙවීම් රු 6,176,681




## 02. ගණන් බැලීම් ඒකකය

විමධ්‍යගත නොවූ විශ්‍රාම ගැන්වීම් වලට අදාළ විශ්‍රාමලාභීන් සඳහා විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික ගණන් බැලීම කරනු ලබන අතර ,ඒ සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ ඊට අදාළ නිකුත් කරන ලද චක්‍රලේඛ අදාළ කර ගනී.

සිවිල් හා අධිකරණ සේවයේ නිළධාරීන් /නිළධාරිනියන්ගේ විශ්‍රාම පාරිතෝෂික හා මාසික විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ අවස්ථා පහත පරිදි වේ .

| අනු<br><br>අංක<br>ය | සිද්ධිය | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ වගන්තිය |
|---|---|---|
| 1 | වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම යාම.(අනිවාර්ය විශ්‍රාම ගැන්වීම) | 2:17 |
| 2 | වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත විශ්‍රාම යාම.(වෛකල්පිත විශ්‍රාම ගැන්වීම) | 2:17 |
| 3 | වයස අවුරුදු55 ත් 60 ත් අතර වයසකදී විශ්‍රාම යාම. | 2:17 |
| 4 | හොබවමින් සිටි තනතුරක් අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම. | 2:7 |
| 5 | දෙපාර්තමේන්තුවක් වසා දමා සංස්ථාවක් බවට පත්කිරීමේදී හොබවමින් සිටි තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම. | 2:7 |
| 6 | වෛද්‍ය හේතු මත විශ්‍රාම යාම. | 2:14 |
| 7 | භාෂා ප්‍රවීණතාවය නොමැතිකම නිසා විශ්‍රාම යාම. | 2:48 (ක) |
| 8 | විශ්‍රාම වැටුප අවුරා තබා සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයට ගොස් විශ්‍රාම යාම. | 2:48 (අ) |
| 9 | රාජ්‍ය  පරිපාලන චක්‍රලේඛ 30/ 88 යටතේ විශ්‍රාම යාම. | 2:14 (30/88) |
| 10 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90යටතේ විශ්‍රාම යාම-සේවා කාලය අනුව මාස | 120ට අඩු- 2:1”අ”<br><br>240-120 2:1”ආ”<br><br>360-240 2:1”ඇ” |
| 11 | හෙදියන්/ ගුරුවරියන්/ පොලිස් කාන්තාවන් සේවා කාලය වසර 20 හෝ වයස අවුරුදු 50 යන දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේ දී විශ්‍රාම යාම. | 2:14 |
| 12 | අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැනීම්. | 2:15 |
| 13 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම | 2:12 |
| 14 | ට උප ලේඛණය සඳහන් වන තනතුරක් හොබවා විශ්‍රාම යාම. | 2: “අ” ”අ” |
| 15 | 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වීම මත විශ්‍රාම යාම. | |
| 16 | විශ්‍රාම පාරිතෝෂකය ලබා ගැනීමට මනාපය පළ කර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට ප්‍රථම මිය යාම. මෙහිදී විශ්‍රාම පාරිතෝෂිකය සමඟ විශ්‍රාම ගිය දිනය අතර හිඟ විශ්‍රාම වැටුප ලබා ගත හැක. | 2:39 (3:1)(උරුමක රුවන්ට) |

| | | |
|---|---|---|
| 17 | විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට  මනාපය පළ නොකර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප ලබා ගැනීමට ප්‍රථම, විශ්‍රාම ගිය දින සිට අවුරුද්දකට පසුව මියයෑම මෙහිදී විශ්‍රාම ගිය දිනය හා මිය ගිය දිනය අතර හිඟ විශ්‍රාම වැටුප ලබාගත හැක. | 2:39:3:1 |
| 18 | විශ්‍රාම වැටුප අවුරා තබා සංස්ථවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතුව සිට, විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීම සඳහා මනාපය පළ කර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට ප්‍රථම මියයෑම. | 2:39:3:1 |
| 19 | විශ්‍රාම වැටුප අවුරා තබා සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතුව සිට, විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීම සඳහා මනාපය පළ නොකර විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප ලබා ගැනීමට ප්‍රථම, විශ්‍රාම ගිය දින සිට අවුරුද්දකට පසුව මියයෑම. | 2:39:3:1 |
| 20 | සේවා පාරිතෝෂික අයදුම් කිරීම. | 29:17<br>29:7<br>29:39:3:1 |

මීට අමතරව,

II. පිරිවෙන් හා පෞද්ගලික පාසැල් ගුරුවරුන්/ ගුරුවරියන් සඳහා විශ්‍රාම වැටුප් තත්වය ලබා දී ඔවුන්ගේ, මරණ පාරිතෝෂික ලබා දිය යුතු අවස්ථාවලදී ඊට අදාළ ගණන් බැලීම් කටයුතු.

III. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් කොන්ත්‍රාත් පදනම මත එම තනතුරේම හෝ වෙනත් තනතුරක වසර දෙකක අවම සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම යන නිලධාරීන් සඳහා ද සංශෝධන විශ්‍රාම වැටුප් ගණන් බැලීම.

IV. විශ්‍රාම වැටුප් සංශෝධනයන්ට ලක් වන පහත සඳහන් අවස්ථාද ,මෙම අංශය යටතේ සිදුවේ .

- විශ්‍රාම යාමෙන් පසුව උසස්වීම් ලැබීම.
- වේතනාධික අඩුවෙන් ගණනය කර නැවත සංශෝධනය කිරීම .
- විවිධ චක්‍රලේඛ යටතේ විශ්‍රාමිකයින්ටද නැවත ප්‍රතිලාභ හිමිවීම.
- නැවත විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත්කර විශ්‍රාම ගැන්වීම මත සංශෝධනය කිරීම.
- කොන්ත්‍රාත් පදනම යටතේ එම තනතුරේ හෝ වෙනත් තනතුරක වසර දෙකක අවම සේවා කාලයක් සම්පූර්ණකර නැවත විශ්‍රාම යන විශ්‍රාමිකයින්ගේ සංශෝධන සකස් කිරීම.
- විනය නියෝග මත සංශෝධනය වීම.

01 / 01 / 2012සිට 31 / 12 / 2012දක්වා අලුතින් ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම සඳහා හා සංශෝධිත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම සඳහා ලිපිගොනු 1595ක් ,ලද අතර එම කාල වකවානුව තුළ සේවා පාරිතෝෂික නිකුත් කිරීම සඳහා ලිපිගොනු 18ක් ලැබුණි.

# ආදායම් ගිණුම - 2012

| ශීර්ෂය | ඇස්තමේන්තු කළ මුදල | සත්‍ය ආදායම |
|---|---|---|
| 20:04:01:00<br>(මධ්‍යම රජය) | 8,105,000,000 | 8,333,779,290 |
| 20:04:02:00<br>(පළාත් සභා | 4,150,000,000 | 3,404,247,640 |

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2012

# එක් එක් වැඩ සටහනක ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

**(වැඩසටහනක ව්‍යපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල මූල්‍යකරණය)**

**දෙපාර්තමේන්තුවේ නම :** **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය :** 253

**වැඩ සටහන් අංකය හා නාමය :** 01

මෙහෙයුම් වැඩසටහන

| මූල්‍යකරණය | | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 87,675,000 | 66,316,116 | 105,587,763,800 | 105,582,621,800 | 105,675,438,800 | 105,648,937,916 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන ප්‍රතිපූරණය කල හැකි | | | | | | |
| 14 | විදේශීය ආධාර - ණය ප්‍රතිපූරණය කල හැකි | | | | | | |
| 15 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් විදේශාධාර සම්බන්ධ | | | | | | |
| 17 | දේශීය අරමුදල් | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 0 | 0 | 21,130,000,000 | 21,117,061,840 | 21,130,000,000 | 21,117,061,840 |
| | **එකතුව** | 87,675,000 | 66,316,116 | 126,717,763,800 | 126,699,683,640 | 126,805,438,800 | 126,765,999,756 |

*වැඩ සටහනක් වෙනුවෙන් අතිරේක පිටු එකතු කරන්නේ නම් අවසාන පිටුවේ එකතුව වැඩ සටහනේ එකත

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2012

**වියදම් ශීර්ෂ අංකය :**
253 **දෙපාර්තමේන්තුවේ නම :** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
**වැඩසටහන් අංකය හා නාමය :** 01 **මෙහෙයුම් වැඩසටහන**

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | ශීර්ෂ අංකය (අදාල ඩී.ජී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 125,199,625,000 | 1,578,813,800 | 6,350,000<br>-6,350,000<br>6,638,355<br>(6,638,355) | 126,778,438,800 | 126,742,151,322 | 36,287,478 | ඩී.ජී.එස්.ඒ - 3 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 17,000,000 | 10,000,000 | 0 | 27,000,000 | 23,848,434 | 3,151,566 | ඩී.ජී.එස්.ඒ - 4 |
| **එකතුව** | **125,216,625,000** | **1,588,813,800** | **0** | **126,805,438,800** | **126,765,999,756** | **39,439,044** | |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

**වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන**

| ඩැය ඩිෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **අංක : 01 - සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සේවා** | | | | | |
| | | | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 6,000,000 | 0 | 6,000,000 | 5,334,478 | 665,522 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 2,500,000 | 0 | 2,500,000 | 1,948,104 | 551,896 |
| | | | හැකියා වර්ධනය | 500,000 | 0 | 500,000 | 115,000 | 385,000 |
| | | | **උප එකතුව** | **9,000,000** | 0 | **9,000,000** | **7,397,582** | 1,602,418 |
| | | | **අංක : 02 - විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| | | | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 500,000 | 0 | 500,000 | 0 | 500,000 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 7,000,000 | 10,000,000 | 17,000,000 | 16,024,352 | 975,648 |
| | | | හැකියා වර්ධනය | 500,000 | 0 | 500,000 | 426,500 | 73,500 |
| | | | **උප එකතුව** | **8,000,000** | **10,000,000** | **18,000,000** | **16,450,852** | **1,549,148** |
| | | | **සමස්ථ එකතුව** | **17,000,000** | **10,000,000** | **27,000,000** | **23,848,434** | **3,151,566** |

# වැයපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| වැයපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම වැයපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01. සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 31,200,000 | 0 | -2,750,000 | 28,450,000 | 28,028,098 | 421,902 |
| අනෙකුත් වියදම් | 47,475,000 | 0 | -6,638,355 | 40,836,645 | 30,890,436 | 9,946,209 |
| **උප එකතුව** | **78,675,000** | **0** | **-9,388,355** | **69,286,645** | **58,918,534** | **10,368,111** |
| **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම..** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 186,000,000 | 0 | 9,388,355 | 195,388,355 | 193,431,589 | 1,956,766 |
| අනෙකුත් වියදම් | 124,934,950,000 | 1,578,813,800 | 0 | 126,513,763,800 | 126,489,801,199 | 23,962,601 |
| **උප එකතුව** | **125,120,950,000** | **1,578,813,800** | **9,388,355** | **126,709,152,155** | **126,683,232,788** | **25,919,367** |
| | | | | | | |
| **මුළු එකතුව** | **125,199,625,000** | **1,578,813,800** | **0** | **126,778,438,800** | **126,742,151,322** | **36,287,478** |

# අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2012

ඩී.ජී.එස්.ඒ - 5 (i)

**වියදම් ශීර්ෂ අංකය:** 253 **දෙපාර්තමේන්තුවේ නම:** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය* | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත අනුව 2012/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2012/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | 2012/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 253011 | 83,253,146.35 | 26,040,785.62 | 28,025,302.46 | 81,268,629.51 | 81,273,425.51 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | | | | | | |
| (i) පොදු තැන්පත් | 6000/0/0/15/133<br>6000/0/0/3/182 | 10,575,875.90<br>175,105.56 | 18,693,727.68<br>175,105.56 | 20,825,897.80<br>0.00 | 12,708,046.02<br>0.00 | 12,708,046.02<br>0.00 |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |

**මු.රෙ.506(2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය, පුද්ගල ගිණුම්වල අදාල ලැයිස්තු සමග සසඳා, එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කල බවට තහවුරු කරමි.**

* තැන්පතු ගිණුම් අංක සටහන් කිරිමේදි භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ ඇතුලත් සම්පූර්ණ ගිණුම් අංකය ඇතුලත් කලයුතු අතර, අක්‍රියව පවතින ගිණුම්ද හෙළිදරව් කල යුතුය.

# එක් එක් වැඩ සටහනක  ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය


**(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල මූල්‍යකරණය)**

**දෙපාර්තමේන්තුවේ නම :** විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
**වියදම් ශීර්ෂ අංකය :** 253
**වැඩ සටහන් අංකය හා නාමය :** 01 මෙහෙයුම් වැඩසටහන

| මූල්‍යකරණය | | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 87,675,000 | 66,316,116 | 105,587,763,800 | 105,582,621,800 | 105,675,438,800 | 105,648,937,916 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 0 | 0 | 21,130,000,000 | 21,117,061,840 | 21,130,000,000 | 21,117,061,840 |
| | **එකතුව** | 87,675,000 | 66,316,116 | 126,717,763,800 | 126,699,683,640 | 126,805,438,800 | 126,765,999,756 |

*වැඩ සටහනක් වෙනුවෙන් අතිරේක පිටු එකතු කරන්නේ නම් අවසාන පිටුවේ එකතුව වැඩ සටහනේ එකතුව විය

# Organizational Structure for the Department of Pension



අනුමත සේවක සංඛ්‍යාව

| අනු අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| 1 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | 3 | 2 | 1 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 5 | නියෝජ්‍ය අධ්‍යක්ෂක්ෂසහකාර අධ්‍ය/ | 7 | 6 | 1 |
| 6 | ගණකාධිකාරී | 7 | 7 | 0 |
| 7 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ක්ෂසහකාර අධ්‍ය/ තො).තා( | 1 | 0 | 1 |
| 8 | නීති නිලධාරී | 1 | 0 | 1 |
| 9 | පරිපාලන නිලධාරී | 4 | 2 | 2 |
| 10 | භාෂා පරිවර්තක | 2 | 1 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | අයවැය සහකාර | 1 | 1 | 0 |
| 12 | විශ්‍රාම වැටුප් නිලධාරී | 340 | 328 | 12 |
| 13 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 5 | 0 | 5 |
| 14 | කාර්මික නිලධාරී | 1 | 0 | 1 |
| 15 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 190 | 163 | 27 |
| 16 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 0 | 5 |
| 17 | ලේඛන සහකාර | 141 | 139 | 2 |
| 18 | බංගලා භාරකරු | 2 | 1 | 1 |
| 19 | අරක්කැමින කම්කරුඋද්‍යා / | 4 | 1 | 3 |
| 20 | රියදුරු | 12 | 12 | 0 |
| 21 | විදුලි කාර්මික ශිල්පි | 1 | 1 | 0 |
| 22 | කාර්යාල කාර්ය සහායක | 56 | 56 | 0 |
| | එකතුව | 786 | 723 | 63 |

## රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
## 2012 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම

| ක්ෂේත්‍රය | කාර්යය | වෙන් කළ මුදල (රු.මිලියන) | අපේක්ෂිත | | | | නිමැවුම | | අපේක්ෂිත ප්‍රතිලාභය | වගකීම් දරණ නිලධාරින්ගේ නම,තනතුර,හා දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | භෞතික | මූල්‍ය | | |
| පාලන හා ප්‍රතිපත්ති | 01. තැපල් අංශය | | | | | | | | කඩිනමින් ලිපිගොනු බෙදාහැරීම | එස්.එන්.සංජීවනී මෙය (සහකාර අධ්‍යක්ෂ 011-2209891 |
| | 1.1 ලිපි හා ගොනු ලැබීම | | 80,000 | 82,000 | 84,000 | 86,000 | 332,000 | | | |
| | 1.2 ලිපි හා ගොනු යැවීම | | 100,000 | 110,000 | 120,000 | 130,000 | 460,000 | | | |
| | 02. ලියාපදිංචි කටයුතු | | | | | | | | අයදුම්පත් ලැබි සතියක් තුල අයදුම්පත් හාසම්බන්ධ සියළු කාර්යයන් නිමකර ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම | |
| | 2.1 නව අයදුම්පත් | | 6,000 | 5,600 | 7,600 | 6,000 | 25,200 | | | |
| | 2.2 සංශෝධන | | 1,850 | 1,350 | 1,650 | 1,850 | 6,700 | | | |
| | 2.3 මරණ පාරිතෝෂික | | 350 | 355 | 375 | 330 | 1,410 | | | |
| | 2.4 ගැටළු හා උපදෙස් පිළිතුරු ලිපි | | 350 | 375 | 300 | 250 | 1,275 | | | |
| | 2.5 RA ක්‍රියාවලි පුහුණු වැඩමුළු | | 10 | 50 | 75 | 100 | 235 | | | |
| | 03. පාලන / පුහුණු කටයුතු | | | | | | | | කාර්ය මණ්ඩල කටයුතු ප්‍රශස්තව ඉටුකිරීම | එන්.අභයවික්‍රම මිය වි.වැ.අ.ජ 011-2209867. |
| | 3.1 කාර්ය මණ්ඩල කටයුතු -ගොනු නඩත්තු | | 760 | 760 | 760 | 760 | 760 | | | |
| | 3.2 පුහුණු | | 2 | 2 | 2 | 2 | 10 | | | |
| | 04. ප්‍රතිපත්ති හා මහජන සම්බන්ධතා | | | | | | | | ප්‍රතිපත්ති තීරණ ගැනීම හා විශ්‍රාම වැටුප් ආශ්‍රිත උපදෙස් නිකුත් කිරීම සහ ගැටළු නිරාකරණය | විශාඛා විජේරත්න ඇලපාත මිය නි.වි.වැ.අ. 011-2209867 |
| | 4.1 චක්‍ර ලේඛ නිකුත් කිරීම | | අවශ්‍යතාව පරිදි | | | | | | | |
| | 4.2 රාජ්‍ය ආයතන හා මහජනයා වෙතින් ලැබෙන ලිපි වලට පිළිතුරු සැපයීම | | 700 | 700 | 700 | 700 | 2,800 | | | |
| | 4.3 ඉදිරි කාර්යාල (Front Office) කටයුතු | | 15,000 | 15,000 | 15,000 | 15,000 | 60,000 | | | |
| | 4.4 1970 කෙටි දුරකථන සේවයට ලැබෙන වලට ලිපි වලට පිළිතුරු සැපයීම | | 8,750 | 8,750 | 8,750 | 8,750 | 35,000 | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 05 . නිති කටයුතු | | | | | | | | | එන්.අභයවික්‍රම මිය<br>වි.වැ.අ.ජ<br>011-2209801 |
| | 5.1 අධිකරණ | | 5 | 5 | 5 | 5 | 20 | | විශ්‍රාම වැටුප් විෂයට අදාලව පැනනගින සියලුම නීතිමය ගැටළු නිරාකරනය කර ගැනීම | |
| | 5.2 පාර්ලිමේන්තු කොමසාරිස් | | 5 | 10 | 10 | 10 | 35 | | | |
| | 5.3 මානව හිමිකම් - පරීක්ෂණ | | 5 | 5 | 5 | 5 | 20 | | | |
| | - පෙත්සම් | | 10 | 20 | 20 | 10 | 60 | | | |
| | 5.4 මහජන පෙත්සම් කාරක සභාව | | 4 | 4 | 4 | 3 | 15 | | | |
| | 5.5 පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව | | 2 | 2 | 2 | 2 | 8 | | | |
| | 5.6 පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න | | 1 | 2 | 1 | 1 | 5 | | | |
| | 5.7 වෙනත් | | 10 | 20 | 20 | 10 | 60 | | | |
| | 06. විදේශ විශ්‍රාම වැටුප් | | | | | | | | විදේශගත විශ්‍රමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම කඩිනම් කිරීම | ආර්.එම්.කේ.සංජීවනී මෙය ස.අ(විදේශ වි.වැ) 011-2209870 |
| | 6.1 විදේශ ධූත මණ්ඩල හරහා ගෙවීම | | 3,200 | 3,200 | 3,200 | 3,200 | 3,200 | | | |
| | 6.2 විදේශ බැංකු ගිණුම් හරහා ගෙවීම | | 3,900 | 3,900 | 3,900 | 3,900 | 3,900 | | | |
| වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු | 01. ලියාපදිංචි අංශය | | | | | | | | විශ්‍රාමිකයා මියගිය පසු එළඹෙන පළමු මාසයේ සිටම වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මහේෂිකා කොඩිප්පිලි ආරච්චි මෙය වි.වැ.අ 011-2209803 |
| | 1.1 වැන්දඹු අනත්දරු | | 2,500 | 2,500 | 2,500 | 2,500 | 10,000 | | | |
| | 1.2 වැන්දඹු පුරුෂ හා අනත්දරු | | 3,500 | 3,500 | 3,500 | 3,500 | 14,000 | | | |
| | 02. ලිපිගොණු ශාඛාව | | | | | | | | | |
| | 2.1 ප්‍රාදේශීය කාර්යාල වෙත ලිපිගොනු යැවීම | | 2,000 | 2,000 | 2,000 | 2,000 | 8,000 | | | |
| | 2.2 ලිපිගොනු යාවත්කාලීන කිරීම | | 5,000 | 5,000 | 5,000 | 5,000 | 20,000 | | | |
| | 03. අරමුදල් කලමනාකරණය | | | | | | | | | |
| | 3.1 අරමුදල් රුස්කිරීම | | මිලියන 800 | මිලියන 800 | මිලියන 800 | මිලියන 800 | මිලියන 3,200 | | | |
| | 3.2 ආයොජන | | මිලියන 100 | මිලියන 100 | මිලියන 100 | මිලියන 100 | මිලියන 400 | | | |
| | 3.3 ආපසු ගෙවීම් | | මිලියන 25 | මිලියන 25 | මිලියන 25 | මිලියන 25 | මිලියන 100 | | | |
| | 04. ප්‍රදාන ශාඛාව | | | | | | | | | |
| | 4.1 ගැටළු සහගත ඉල්ලීම් සඳහා ප්‍රදාන නිකුත් කිරීම | | 200 | 200 | 200 | 200 | 800 | | | |
| | 4.2 ආබාධිත ප්‍රදාන නිකුත් කිරීම | | 70 | 70 | 70 | 70 | 2800 | | | |
| | 05. විමර්ශන කටයුතු | | | | | | | | | |
| | 5.1 වැන්දඹු අනත්දරු ගෙවීම | | 20 | 20 | 20 | 20 | 80 | | | |
| | 5.2 ආබාධිත ගෙවීම් | | 15 | 15 | 15 | 15 | 60 | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 06 ලේඛන කළමනාකරණය | | | | | | | | | |
| | 6.1 ලේඛන පවත්වාගෙන යාම | | | | | | 1,500,000 | | | |
| | 6.2 ලේඛන නිකුත් කිරීම | | 10,000 | 15,000 | 15,000 | 10,000 | 50,000 | | | |
| | 07. තැපල් ශාඛාව | | | | | | | | | |
| | 7.1 ලියාපදිංචිය | | 8,000 | 8,000 | 8,000 | 8,000 | 32,000 | | | |
| ව්‍යාපෘති හා සංවර්ධන | 7.2 බෙදා හැරීම | | 8,000 | 8,000 | 8,000 | 8,000 | 32,000 | | | |
| | 01. තොරතුරු තාක්ෂණ | | | | | | | | තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම තුලින් සක්‍රීයනය වූ ඉ-විශ්‍රාම වැටුප් පරිසරයක් සකස් කිරීම | "මහේෂිකා කොඩිප්පිලි ආරච්චි මෙය වි.වැ.අ 011-2209803" |
| | 1.1 වෙබ් අඩවි සංවර්ධනය | | 5 | 5 | 5 | 5 | වෙබ් පිටු 20 | | | |
| | 1.2 මෘදුකාංග නිෂ්පාදනය e- pension cr1 cr2 | | 1 | - | 1 | - | 2 | | | |
| | 1.3 පරිගණක මෙහෙයුම් කටයුතු | | 25 | 25 | 25 | 25 | 100 | | | |
| | 1.4 දෙපාර්තමේන්තුගත තොරතුරු ආකර්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | | | | | | වසර පුරාම | | | |
| | 1.5 ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු | | | | | | | | | |
| | 1.6 ප්‍රසම්පාදනයේදී තාක්ෂණික උපදෙස් ලබාදීම | | | | | | අවශ්‍ය අවස්ථා වලදී | | | |
| | 02 ඉ - විශ්‍රාම වැටුප් | | | | | | | | | |
| | 1.1 පුහුණු වැඩසටහන් | | | | | | | | | |
| | 1.1.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | 12 | 12 | - | - | 24 | | | |
| | 1.1.2 රාජ්‍ය ආයතනයන්හි ස්ථාපනය | | - | - | 36 | 36 | 72 | | | |
| | 1.2 දත්ත සංක්‍රමනය | | | | | | | | | |
| | 1.2.1 මූලික දත්ත සකසා ගැනීම | | 12 | 12 | 1 | - | 25 | | | |
| මූල්‍ය කළමනාකරණය | 01. විශ්‍රාම වැටුප් ගෙවීම | | | | | | | | සාමාන්‍ය පරිපාලනය සහ විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම යන ව්‍යාපෘති සදහා අවශ්‍ය කාර්යක්ෂම මූල්‍ය පාලනයක් පවත්වා ගැනීම | කේ.වී.දිසානායක මිය ප්‍රධාන ගණකාධිකාරී 011-22309804 |
| | 1.1 මාසික විශ්‍රාම වැටුප් | මිලියන 95,130 | මිලියන 23,000 | මිලියන 23,500 | මිලියන 24,300 | මිලියන 24,300 | ප්‍රති ලාභීන් 500,000 | මිලියන 95,130 | | |
| | 1.2 පාරිතෝෂික | මිලියන 15,000 | මිලියන 3,000 | මිලියන 3,000 | මිලියන 4,000 | මිලියන 5,000 | ප්‍රති ලාභීන් 15,000 | මිලියන 15,000 | | |
| | 02. වෙනත් (සාමාන්‍ය පරිපාලනය) | | | | | | | | | |
| | 2.1 පුනරාවර්තන | මිලියන 15,070 | මිලියන 3,500 | මිලියන 3,700 | මිලියන 3,920 | මිලියන 3,920 | | මිලියන 15,070 | | |
| | 2.2 මූලධන | මිලියන 27 | මිලියන 06 | මිලියන 07 | මිලියන 07 | මිලියන 07 | | මිලියන 27 | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුල | 01. ලියාපදිංචි කිරීම | | 1,500 | 1,500 | 1,500 | 1,500 | 6,000 | | රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ගෙවීම ප්‍රමාදයකින් තොරව සිදු කිරීම | එස්.එන්.හපුආරච්චි මිය ලේකම් හා ගණකාධිකාරී 011-2209861 |
| | 02. දායක මුදල් එකතු කිරීම | | මිලියන 550 | මිලියන 550 | මිලියන 550 | මිලියන 550 | | මිලියන 2,200 | | |
| | 03. ආයෝජන | | මිලියන 850 | මිලියන 850 | මිලියන 850 | මිලියන 850 | | මිලියන 3,400 | | |
| | 04. දායක මුදල් ආපසු ගෙවීම | | මිලියන 100 | මිලියන 100 | මිලියන 150 | මිලියන 150 | | මිලියන 500 | | |
| විගණන කටයුතු | 01. අභ්‍යන්තර විගණන කටයුතු | | | | | | | | විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව නිවැරදි ක්‍රමවේදයක් හඳුන්වාදීම | ඒ.එච්.එම්.කේ.කේ. හේරත් මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක 011-2209805 |
| | 1.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | 25 | 25 | 25 | 25 | 100 | | | |
| | 1.2 අනෙකුත් රාජ්‍ය ආයතන | | 15 | 20 | 20 | 15 | 70 | | | |
| | 02. රජයේ විගණන විමසුම් | | | | | | | | | |
| | 2.1 විගණකාධිපති දෙපාර්තමේ | ලැබෙන පරිදි | | | | | | | | |
| | 2.2 රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | | | | | | | | | |
| | 03. විගණන කමිටු කටයුතු | | 1 | 1 | 1 | 1 | 4 | | | |
| | 04. විමර්ශන | | | | | | | | | |
| | 4.1 මහජන පැමිණිලි | ලැබෙන පරිදි | | | | | | | | |
| | 4.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලිපිගොනු | | | | | | | | | |
| | 4.3 විශේෂ පරීක්ෂණ | අවස්ථානුකූලව | | | | | | | | |